අරුණ හා සතිඅග අරුණ පුවත්පත් තුළ පළවූ ප්‍රවෘත්ති වාර්තාවන් දෙකක සිරස්තල තුළ "කොරෝනා මව බිහිකළ බිලිඳාගේ පී.සී.ආර්. දෙකම නෙගටිව්", "ලංකාවේ කොරෝනා මවක් මුල්වරට දරුවකු බිහි කළ වගයි" ආදී වශයෙන් සඳහන් වේ. නමුත් මෙම පුවත් වාර්තාවන්හි අන්තර්ගතයන් තුළ එම තැනැත්තිය සම්බන්ධයෙන් සඳහන් වන්නේ "කොවිඩ් වැළඳුණු මව", "කොවිඩ්-19 ආසාදිත කාන්තාවක" ලෙසිනි. මින් පෙරද සිරස්තල යෙදීම පිළිබඳව ප්‍රශ්න කෙරුණු අවස්ථාවන්හිදී එම සාකච්ඡාවන්ගෙන් මතු කෙරුණු කාරණයක් වූයේ, බොහෝ විට පුවත් වාර්තාවන් සඳහා සිරස්තල යොදනු ලබන්නේ පුවත් වාර්තාව ලියූ මාධ්‍යවේදියා නොවන බවයි.

යම් පුද්ගලයෙකු කොවිඩ්-19 රෝගියෙකු වීම කිසිසේත්ම එම පුද්ගලයාගේ වරදක් නොවේ. මෙසේ බලන විට "කොරෝනා මව" වැනි යෙදුමකින් පුද්ගලයින්ව හැඳින්වීම කෙතරම් සදාචාර සම්පන්න වන්නේද? මේ පිළිබඳව ඔබේ අදහස කුමක්ද?

#MediaEthicsSL #lka #Aruna #SathiAgaAruna #SinhalaPress